**මාලිම්බඩ ප්‍රාදේශීය සභාව**
**මාතර දිස්ත්‍රික්කය**
**-------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජූලි 26 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1. ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) පළාත් නිශ්චිත ප්‍රතිපාදන යටතේ මිලදී ගෙන තිබූ ට්‍රැක්ටරය හා ට්‍රේලරයේ රු.1,500,000 ක් වූ වටිනාකම ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සභාවේ සේවයේ නියුතුව සිටි තාවකාලික කම්කරුවෙකු වෙනුවෙන් අර්ථසාධක අරමුදලට ගෙවීමට සිදු වී තිබූ රු.86,220 ක අධිභාර මුදල මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේ මාලිම්බඩ පුස්තකාලය වටා තාප්පය ඉදි කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් ගෙවා තිබූ රු. 817,521 ක මුදල ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඈ) 2011 අගෝස්තු මාසයේදී පරිත්‍යාග ලෙස සභාවට ලැබී තිබූ රු.34,500 ක් වටිනා පර්චස් 18.93 ක ඉඩමේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

(ඉ) 2015 වසර වෙනුවෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.232,999 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

**1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසානයට එකතුව රු.32,608,105 ක් වූ ණයගැති ශේෂය තුළ වර්ෂ 03 ක කාලයක් ඉක්මවා තිබූ රු.3,898,736 ක ශේෂ 27 ක් ඇතුළත්වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසානයට එකතුව රු.9,267,664 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ තුළ වර්ෂ 03 ක කාලයක් ඉක්මවා තිබූ රු.1,559,886 ක ශේෂ 26 ක් ඇතුළත්වී තිබුණි.

**1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

එකතුව රු.105,595,281 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් අදාළ හිමිකම් ඔප්පුද රු.3,112,855 ක් වූ විවිධ ණයගැතියෝ සහ රු.9,033,803 ක් වූ විවිධ ණයහිමියෝ සම්බන්ධයෙන් ශේෂ තහවුරු කිරීමේ ලිපි හා කාල විශ්ලේෂණද, රු.2,831,387 ක් වූ තැන්පතු වර්ග 06 ක් සම්බන්ධයෙන් විස්තරාත්මක උපලේඛණ යනාදී සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.4 නීති, රීති , රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571 පරිදි කල් ඉකුත් වූ රු.853,525 ක විවිධ තැන්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.15,200,750 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.4,527,409 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.10,673,341 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

**2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ මුළු පුනරාවර්තන ආදායමින් සියයට 62 ක් තරම් මුළු පුනරාවර්තන වියදම් පැවති බව නිරීක්ෂණය විය

(ආ) සභාවේ ස්වයං උත්පාදිත ආදායම් ඉක්මවා වර්ෂ තුනෙහිම සැලකිය යුතු අගයන්ගෙන් පුනරාවර්තන වියදම් වැඩි වී තිබුණ අතර, ස්වයං උත්පාදිත ආදායම් වලින් පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීමට නොහැකි තත්ත්වයක් පෙන්නුම් කෙරුණි.

## 2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

ජංගම හා ක්ෂණික අනුපාතයන් 1:4.3 ක් ලෙස දැක්වුණද, ණයගැති ශේෂය තුළ රු.4,652,878 ක ලැබිය යුතු ප්‍රාග්ධන ආධාරද, ඉන් ලැබිය යුතු මුද්දර ගාස්තු සියයට 65 ක්ද පැවතීමෙන් එම අනුපාතයන් ප්‍රකාරවම ද්‍රවශීලතා තත්ත්වයක් නොපවතින බව නිරීක්ෂණය විය.

### 2.3.1 ආදායම් පරිපාලනය

### 2.3.2 වරිපනම් බදු

ආරම්භක හිඟ වරිපනම් බදු ශේෂය රු.91,579 ක් වූ අතර, වර්ෂයේ බිල්කිරීම් සමඟ රු.237,474ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.162,136 ක් වීමෙන් 2016 දෙසැම්බර් 31 දිනට රු.75,338 ක ශේෂයක් හිඟ තිබුණි.

### 2.3.3 බදු කුලී

ආරම්භක හිඟ කඩ කුලී ශේෂය රු.121,520 ක් වූ අතර, වර්ෂයේ රු.1,388,018ක බිල්කිරීම් සමග රු.1,509,538 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.1,416,318 ක් වීම නිසා වර්ෂය අවසානයට හිඟ ශේෂය රු.93,220 ක් විය.

### 2.3.4 ව්‍යාපාර බදු

ආරම්භක ව්‍යාපාර බදු හිඟ ශේෂය රු.13,800 ක් වූ අතර වර්ෂයේ බිල් කිරීම් රු.626,990 ක් සමඟ රු.640,790 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.623,990 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.16,800 ක මුදලක් හිඟව පැවතුණි.

### 2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට උසාවි දඩ වෙනුවෙන් රු.1,153,302 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.26,972,487ක මුදලක් අය විය යුතුව තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධන ඇගයීම

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයට අනුව සහා අරමුදලින් සංවර්ධන වැඩ යෝජනා 61 ක් ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා දී තිබුණද, වර්ෂය තුළ එක් සංවර්ධන යෝජනාවක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි. නමුත් සභාවේ මාසික සාමාන්‍ය මුදල් ශේෂය රු.4,044,934 ක් වූ අතර ඒ අනුව සභාවට කර්මාන්ත කළ හැකි මූල්‍ය තත්ත්වයක් තිබුණි.

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

ද්විතියික හා ප්‍රාථමික තනතුරුවල පැවති පුරප්පාඩු 02 ක් පුරවා ගැනීමට හෝ තනතුරුවල පවතින 04 ක් වූ අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේ තිබියදී ආදේශක පදනම මත තවත් සේවකයින් 06 දෙනෙකු සේවයේ යොදවාගෙන වැටුප් හා දීමනා ලෙස රු.1,255,476 ක මුදලක් ගෙවා තිබුණි.

### 3.3 මතභේදයට තුඩු දෙන ගනුදෙණු

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු ගල් රෝල පෞද්ගලික ව්‍යාපාරිකයෙකුට බදු දී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය වන විට, ඇප තැන්පත් මුදල රු.22,900 ක් හා යන්ත්‍ර පැය 70ක් සඳහා අය විය යුතු රු.105,000 ක මුදලක් සභාවට අය වී නොතිබුණි.

(ආ) (i) මාලිම්බඩ අලවත්ත හේන පොදු සුසාන භූමියේ ආදාහනාගාරයක් ඉදි කිරීම සඳහා 2000 ජනවාරි 08 වැනි දින පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු රු.1,000,000 ක මුදලින් කොන්ත්‍රාත්කාර සමාගම වෙත රු.100,000 ක් ගෙවා තිබුණි. අදාළ මුදල ගෙවා වසර 17 ක් ගත වී තිබුණද, කර්මාන්තයේ වැඩ අවසන් කර නොතිබුණි.

(ii) ඉතිරි රු.900,000 ක මුදල සභාව නමින් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර රු.3,921,386 ක් උපයාගෙන තිබුණද ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු මුදල රු.13,430,000 ක් දක්වා වැඩි වී තිබුණි.

(iii) ආදාහනාගාරයක් ඉදි කිරීම සඳහා 1999 අප්‍රේල් 26 දින ද ඉඩමක් ලබාගෙන තිබූ නමුත්, එම ඉඩමේ හෝ ආදාහනාගාරයක් ඉදිකර නොතිබුණි.

## 3.4 නිෂ්ක්‍රීය/ඌණ උපයෝජිත වත්කම්

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු අක්කර 09 රූඩ් 01 පර්චස් 36 ක් වූ ඉඩම් කැබලි 10 ක් නිෂ්කාර්යව පැවති අතර, සභාව සතු ඉඩම් කැබලි 38 ක මායිම් ලකුණු කර ආරක්ෂා කර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) සභාව විසින් මිලදී ගෙන තිබූ රු. 175,644 ක් වටිනා කුට්ටිගල් නිෂ්පාදන යන්ත්‍රය 2012 වර්ෂයේ සිට නිෂ්ක්‍රීයව තිබුණි.

## 3.5 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය වෙනුවෙන් සභාව විසින් 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය අවසානය දක්වා රු.2,786,399 ක් වියදම් දරා තිබූ අතර, 2011 වර්ෂයේ සිට මධ්‍යම පරිසර අධිකාරියෙන් ලද ප්‍රතිපාදන මත රු.6,114,025 ක මුදලක් වැය කර කොම්පෝස්ට් අංගනයක් ඉදි කර තිබුණි. එහෙත් ඉකුත් වර්ෂය හා සමාලෝචිත වර්ෂය තුළ සභාව විසින් පිළිවෙලින් කාබනික පොහොර කිලෝග්‍රෑම් 19,235 ක් සහ 28,140 ක් පමණක් නිෂ්පාදනය කර තිබුණි.

# 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත් වියදම් විෂයයන් 08 ක එකතුව රු.15,692,031 ක ඉතිරිවීම් ද වැය විෂයයන් දෙකක අහිතකර විචලනයන්ගේ එකතුව රු.5,441,013 ක් ද පැවතීම නිසා අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 4.2 අභ්‍යන්තර විගණනය

ශ්‍රී ලංකා රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 133 හා 134 යන රෙගුලාසිවල දැක්වෙන විධිවිධානයන් සහ දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ව.ලේ. දරන චක්‍රලේඛය ප්‍රකාර ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබූ නමුත් සභාව විසින් පත් කර තිබූ අභ්‍යන්තර විගණන නිලධාරියාට සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දීමනා ලෙස රු.492,445 ක මුදලක් ගෙවා තිබුණි.

## 4.3 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

2000 මාර්තු 15 වැනි දිනැති අංක පීඑන්/පීඊ/පී.7 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයට යොමු දක්වමින් 2004 දෙසැම්බර් 22 දින පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් නිකුත් කර තිබුණු අංක මාර/වාස/වි/ක දරන ලිපිය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) වත්කම් කළමනාකරණය

(ඇ) ආදායම් පාලනය

(ඈ) අයවැය පාලනය